**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය - 2019**

**-------------------------------------------------------------**

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2639 එස්ආර්අයි දරණ ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ අංක 2639/2640 (එස්එෆ්) එස්ආර්අයි දරණ ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සහ 2012 නොවැම්බර් 19 දින එළඹි අංක 2890 එස් ආර්අයි (එස්එෆ්) සහ අංක 2891 එස්ආර්අයි දරණ ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.04 සහ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම්වලට අනුව, එවකට වරාය සහ මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාර්ග සංවර්ධන අධිකාරිය ජාතික මට්ටමින් ව්‍යාපෘතියේ කටයුතු කළමණාකරනය සහ සම්බන්ධීකරණය කිරීම සඳහා වගකිනු ලැබේ. අතිරේක ණය ගිවිසුම යටතේ උතුරු සහ උතුරු මැද පළාත් වල ජාතික මාර්ගයවල කිලෝමීටර් 170 ක් සහ කිලෝමීටර් 80 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,790 කට සමාන එජඩො මිලියන 146 ක් වූ අතර ඉන් රු.මිලියන 14,950 කට සමාන එජඩො මිලියන 130 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. තවද 2012 නොවැම්බර් 12 දිනැති 2890 එස් ආර්අයි (එස්එෆ්) දරණ අතිරේක ණය ගිවිසුම යටතේ රු.මිලියන 8,840 කට සමාන එජඩො මිලියන 68 ක් ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර ඉන් රු.මිලියන 4,420 කට සමාන එජඩො මිලියන 34 ක් උතුරු සහ උතුරු මැද පළාත්වල පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වෙන්කර තිබුණි. ඊට අමතරව 2012 නොවැම්බර් 12 දිනැති 2891 එස් ආර්අයි දරණ ණය ගිවිසුම යටතේ උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ගය සඳහා රු.මිලියන 3,900 කට සමාන එජඩො මිලියන 30 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු මුල් ණය ගිවිසුම යටතේ 2010 ඔක්තෝම්බර් 22 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට නිම කර තිබුණි. අතිරේක මූල්‍ය පහසුකම් යටතේ ව්‍යාපෘතියේ කටයුතු 2013 මැයි 13 දින ආරම්භ කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර එය 2019 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි.තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දූස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල<br>රු.<br>මිලියන | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | උතුරු මාර්ග සම්බන්ධ කරන ව්‍යාපෘතිය අනෙකුත් ව්‍යාපෘති 03ක් සමග සෙත්සිරිපාය ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබන අතර විදුලිය, දුරකථන, ජලය ගොඩනැගිලි කුලිය යනාදී පොදු කාර්යය පිරිවැය රු. මිලියන 3.71ක් අනෙකුත් ව්‍යාපෘති 03 අතර බෙදාහැරීමකින් තොරව උතුරු මාර්ග සම්බන්ධ කරන ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කර තිබුණි. | බෙදා වෙන් නොකල පිරිවැයෙන් ව්‍යාපෘතියේ මුළු පිරිවැය වැඩි වේ. | NRCP ව්‍යාපෘතිය සඳහා ස්ථාපනය කල එකම කාර්යාලය තුල ව්‍යාපෘති 04ක් ක්‍රියාත්මක වේ. බොහෝමයක් සම්පත් NRCP ව්‍යාපෘතියට අයිති ඒවා වේ. ව්‍යාපෘති අතර පොදු වියදම් වෙන් කිරීම නිවැරදි ක්‍රමය වුවද භාවිතයේදී පහත ගැටළු වලට මුහුණ දේ. මෙම ගැටළු ECIP සඳහා 2018දී යොමු කල විගණන විමසුම් සඳහා සහ TPPE වෙනුවෙන් 2019දී යොමු කරන ලද විගණන විමසුම් වලට පිළිතුරු සැපයීමේදී විස්තර කර තිබුණි.ව්‍යාපෘති පදනම මත පොදු වියදම් සඳහා වෙනම මුල් ඉන්වොයිසියක් ලබා ගැනීම අපහසු වේ. උදාහරණයක් ලෙස ගොඩනැගිලි කුලිය සඳහා එක ඉන්වොයිසියක් ලැබීම. එම ඉන්වොයිසිය භාවිතයෙන් අවශෝෂණය කල වියදම් ප්‍රමාණය අයකර ගැනීම අපහසු වේ. ණය නියෝජිත ආයතනය ලියවිලිවල පිටපතක් පිළිනොගනී. | ව්‍යාපෘතිවල නිවැරදි පිරිවැය දැක්වීම සඳහා පොදු කාර්යය පිරිවැය අනෙකුත් ව්‍යාපෘති අතර බෙදාහැරිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය අනෙකුත් ව්‍යාපෘති 03හි කටයුතු අධීක්ෂණය කිරීම සඳහා වගකියනු ලබන අතර අනෙකුත් ව්‍යාපෘති අතර සමානුපාතිකව බෙදා හැරීමකින් තොරව සියළුම ව්‍යාපෘති සඳහා පොදුවේ දරණ ලද එකතුව රු. මිලියන 32.27ක වර්ධක පිරිවැය මෙම ව්‍යාපෘතියේ පිරිවැයක් ලෙස දරා තිබුණි. | බෙදා වෙන් නොකල පිරිවැයනේ ව්‍යාපෘතියේ මුළු පිරිවැය වැඩි වේ. | ඉහත (අ) පරිදි පිළිතුර සමාන වේ. කෙසේවෙතත්, ගැටළු පහත පරිදි විස්තර කිරීමට මම කැමති වෙමි. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පිටු අංක 11 උපලේඛණ 01පරිදි වර්ධක පිරිවැය රු. 32, 237,872.65ක් වේ. මෙයට කාර්යය මණ්ඩලයේ වේතන ලෙස රු. මිලියන 23.81ඇතුලත්වන අතර රුපියල් මිලියන 5.4ක් මොටර් වාහන කුලී වියදම් වේ.ඉතිරි රු.මිලියන 3.41 තුල අනෙකුත් විවිධ වියදම් ඇතුලත් වේ. මෙම වියදම් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය යටතේ අධීක්ෂණය කරන සියළුම ව්‍යාපෘති සඳහා අදාල වේ. NRCP කාර්යය මණ්ඩලය අනෙකුත් ව්‍යාපෘති 03හි කටයුතු පමණක් මෙහෙයවන අතර ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි නිසා අනෙකුත් ව්‍යාපෘති අතර රු. මිලියන 23.81ක මෙම වියදම වෙන් කිරීමට අපහසු වේ. ඒ යටතේ PMU ඉතිරි පිරිවැයත් ප්‍රධාන ව්‍යාපෘතියට ගිණුම්කර ඇත. | ව්‍යාපෘතිවල නිවැරදි පිරිවැය දැක්වීම පොදු කාර්යය පිරිවැය අනෙකුත් ව්‍යාපෘති අතර බෙදාහැරිය යුතුය. |
| (ඇ) | ජර්නල් අංක 19-116 ට අනුව, 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුට එකතුව රු. මිලියන 40ක් ගෙවිය යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 37.93ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල උපචිත වියදම් රු.මිලියන 2.07කින් අඩුවෙන් දැක්වේ. | එකග වේ. 2019 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී මෙය සිදු වී ඇත.2019.01.01 දිනට සමුච්චිත උපචිත වියදම් ශේෂය රු.146,230,006.77ක් විය. එය 2019 වර්ෂය තුලදී රු.148,651,119.80 නිරවුල් කර තිබේ.වැඩියෙන් ගිණුම්ගත වීම රු. 2,071,113.03වේ. උප ලේඛණ පිළියෙල කිරීමේ | අදාල ලෙජර ගිණුම්වල නිවැරදි කිරීමසිදු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | එම ගිණුම් ඉදිරියට ගෙන යාමේදී රු. 2,071,113.03කින් අඩුවෙන් දක්වා තිබුණි.වැරදි ලෙස TM/S Tudawe Brothers – CP 24 උපචිත මුදල ගලපා ඇත. උපචිත වියදම් ගණනය කිරීම සහ සැසඳීමෙහි ප්‍රකාශය අමුණා ඇත. 2020 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී අදාල ගිණුම් නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. |

## 2.2 රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් ව්‍යාපෘතියේ ගණුදෙනු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | ----------------- | ------------ | ---------- | --------------- | ----------- |
| (අ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජුලි 26 දිනැති අංක 05 දරණ කළමණාකරන විගණන චක්‍රලේඛය | මාර්ග සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත් නොවේ. | ව්‍යාපෘති කටයුතු පිළිබඳ අධීක්ෂණ යාන්ත්‍රණය දුර්වල මට්ටමක පවතී. | 2019 අවසාන වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත නිසා අභ්‍යන්තර විගණක වරයෙකු බඳවා නොගන්නා ලදී. | ව්‍යාපෘතියේ ගණුදෙනු මාර්ග සංවර්ධන අධිකාරිය අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය විගණනය කල යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය තුලදී රු. මිලියන 105.6 ක පිරිවැයකට මිලදී ගන්නා ලද දේපල පිරිවැය සහ උපකරණ පිළිබඳ භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | අනෙකුත් අරමුණු සඳහා යොදා ගැනීමට, අවභාවිතයට සහ හානිවීමට ඉඩ ඇත. | භාණ්ඩ සමීක්ෂණය 2019 දෙසැම්බර් ආරම්භ කරන ලද අතර වර්ෂ අවසාන ගිණුම් පියවීම හේතුවෙන් සමාලෝචනයේ ප්‍රමාදයන් සිදු විය.2020පලමු කාර්තුව තුලදී නිම කිරීමට එකග විය. කෙසේවෙතත්, කොවිඩ් 19 හේතුවෙන් සිදු කිරීමට නොහැකි විය. | මුදල් රෙගුලාසිවල දී ඇති උපදෙස් සමග අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තුකර නොතිබුණි. | අනෙකුත් අරමුණු සඳහා යොදා ගැනීමට, අවභාවිතයට සහ හානිවීමට ඉඩ ඇත. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් සමග අනුකූල වීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ලැබී තිබුණු තොරතුරු අනුව 2015 දෙසැම්බර් 31 දිනට පුනරුත්ථාපනය කල ජාතික මාර්ග 3ක වර්ෂ 3ක කාර්යසාධනය මත නඩත්තු කටයුතු ඇතුළුව කොන්ත්‍රාත් පැකේජ 10ක් යටතේ පිරිනමන ලද උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ග 6ක කොටස් කිලෝමීටර 170ක පුනරුත්ථාපන කටයුතු අවසන් කර තිබුණි. තවද, ආරම්භක ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ මාර්ග පුනරුත්ථාපනය මත ඉතුරුම් භාවිතයෙන් 2015 දී අනෙකුත් ජාතික මාර්ගයන් හි පුනරුත්ථාපනය සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත්තුව 2016 දී නිම කර තිබුණි. ඊට අමතරව 2016 දෙසැම්බර් 31 දිනට අතිරේක මූල්‍ය පහසුකම් යටතේ උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ග 7ක කිලෝමීටර 121.98 ක කොටස් පුනරුත්ථාපන කටයුතු අවසන් කර තිබුණි. ණය මුදලෙහි ඉතුරුම් වලින් මහනුවර යාපනය මාර්ගයේ රබෑව සිට මැදවච්චිය දක්වා කොටසේ (140+760KM සිට150+400KM දක්වා) කිලෝමීටර 9.64ක් පුනරුත්ථාපනය සඳහා 2017 අප්‍රේල් 28 දින නව කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර 2018 ඔක්තෝබර් 31 දිනට නිමකර තිබුණි. තවද, ව්‍යාපෘතිය මැදවච්චිය හෙරොව්පතාන මාර්ගයේ කිලෝමීටර 10+000 සිට කිලෝමීටර 37+800 දක්වා කොටස පුනරුත්ථාපනය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබුණු අතර ඒ සඳහා කොන්ත්‍රාත් 2ක් පිරිනමා තිබුණි. කෙසේවෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට සියයට 100 ක භෞතික ප්‍රගතියක් අත්කර ගැනීමට අපේක්ෂාකර තිබුණද පුනරුත්ථාපන කටයුතු පිළිවෙලින් සියයට 58ක සහ සියයට 64ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | -------------- | ---------- | ------------------------ | ------------- |
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය සැලකීමකින් තොරව 2019 මැයි රු. මිලියන 1,388.22 පිරිවැයකට කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට බී 282 මැදවච්චිය හොරොව්පතාන මාර්ගයේ 10+000Km සිට 23+000 Km දක්වා කොටස සහ 23+000 Km සිට 37+800 Km දක්වා කොටස පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම සඳහා අතිරේක කොන්ත්‍රාත් 2ක් පිරිනමා තිබුණු අතර 2019 දෙසැම්බර් අවසන් කිරීමට එකග වී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් කටයුතු නිම | කොන්ත්‍රාත්වල පිරිවැය සහ ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඉඩ ඇත. | ණය මුදලෙහි ඉතුරුම් භාවිතයට කොන්ත්‍රාත් පැකේජ සීපී 23 සහ සීපී 24 යෝජනා කරන ලදී. 2018 නොවැම්බර් 18 දින 2019 දෙසැම්බර් 31 දින තෙක් ණය දීර්ඝ කිරීම අනුමත කර තිබුණි. පසුව සීපී 23 සහ සීපී 24 අතිරේක කොන්ත්‍රාත් පැකේජ ප්‍රසම්පාදනය ආරම්භ කරන ලදී.අඩු වැඩ විෂය පථය හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජවල කාලය මාස 09ක් සඳහා එකග වී තිබුණි. මීට පෙර බෝක්කු බොහෝමයක් පුනරුත්ථාපනය කර තිබුණි. ලංසු 2019 ජනවාරි 22 දින ආරාධනා | කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරුවන් පෙළඹවීමට අවශ්‍ය පියවර ගත යුතු අතර ඉදිකිරීම් කටයුතු පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදු කිරීම අවශ්‍ය වේ. |

කිරීමට කාල දීර්ඝ කිරීම් ලබාදීමෙන් පසුවද එම කොන්ත්‍රාත් කටයුතු විගණන දිනය වූ 2020 ජුනි 23 දින වන විටත් නිම කර නොතිබුණු බව අනාවරණය විය.

කල අතර කොන්ත්‍රාත් 2019 මාර්තු 26 දින පිරිනමා තිබුණි. 2019 මාර්තු 30 දින කටයුතු ආරම්භ කර තිබුණු අතර 2019 දෙසැම්බර් අවසාන වන විට නිම කිරීමට අපේක්ෂිත විය. ණය කාලසීමාව තුලදී සියළුම ඉදිකිරීම් කටයුතු නිමකර තිබුණු අතර ණය ඇවර කරන කාලය තුල ගෙවීම් සිදු කිරීමට අවසර දී තිබුණි. අවාසනාවට රට තුල පැවති තත්ත්වය හේතුවෙන් 2019 අප්‍රේල් ඇදිරිනීතිය පනවන ලදී. ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සඳහා පවා පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීමට රජය සීමාකරන ලදී. මෙම ත්ත්වය ඉදිකිරීම් කටයුතු සඳහා අහිතකර ලෙස බලපාන ලදී. කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව රජය විසින් ගනු ලබන ඕනෑම පියවරක් හේතුවෙන් ප්‍රගතියේ අඩුවීමක් පවතිනම් කොන්ත්‍රාත්තුව නිම කිරීමට කාලය දීර්ඝ කිරීම් ලබා ගැනීමට කොන්ත්‍රාත්කරු සුදුසුකම් ලබයි. (8.5 උප වගන්තිය අධිකාරී මගින් සිදුවන ප්‍රමාදයන්) ඒ අනුව කාලය දීර්ඝ කිරීම් ලබා දීම මගින් කොන්ත්‍රාත් 2020 මාර්තු සහ 2020 අප්‍රේල් මුල වන විට නිම කිරීමට අනුමත කර තිබුණි.තවද, 2020 මාර්තු සිට මැයි දක්වා කොවීඩ් 19 වසංගතය ඉදිකිරීම් කටයුතු වලට බලපාන ලද අතර කොන්ත්‍රාත්කරුවන්ට වැඩ බිම තාවකාලිකව වසා දැමීමට සිදු විය. ඒ අනුව ප්‍රමාදයන් පිළිගත හැකි හේතුන් නිසා වේ. කොන්ත්‍රාත් 2020 අගෝස්තු නිම කිරීමට අපේක්ෂිත වේ. කොන්ත්‍රාත් පැකේජ සීපී 23 සහ සීපී 24 පිළිවෙලින් 2020 අගෝස්තු 05 සහ 2020 අගෝස්තු 10 දිනට සැලකිය යුතු ලෙස නිම කර ඇත.

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් ඒ 009 නුවර සිට යාපනය මාර්ගයේ රබෑව සිට මැදවච්චිය දක්වා කොටසේ (140+ 760 Km සිට 150+400 Km දක්වා) පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා පිළියෙල කරන ලද පිරිවැය ඇස්තමේන්තුව පිරිනමන ලද කොන්ත්‍රාත්තුවේ පිරිවැය ඉක්මවා සියයට 3.01ක් නියෝජනය කරන රු. මිලියන 24.12 දක්වා වැඩිවී තිබුණි. තවද, ප්‍රමාණ පත්‍රවල සඳහන් ආයිතමයන් 32 ඇස්තමේන්තු ගත වැඩ ප්‍රමාණ ඉක්මවා සියයට 59.66 සිට සියයට 1845 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණු අතර පිරිනමන ලද කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවා එකතුව රු. මිලියන 136.63ක් ගෙවා තිබුණි. | අමතර පිරිවැය දැරීමට සිදු වේ. | ඒ 009 මාර්ගයේ නුවර යාපනය මාර්ග කොටසේ රබෑව සිට මැදවච්චිය දක්වා (කිලෝමීටර් 140+760 සිට කිලෝමීටර් 150+400 දක්වා) කොටසේ පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා පිළියෙල කරන ලද ඇස්තමේන්තුව රුපියල් මිලියන 960ක් විය.මුල් කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 799.85 ක් වූ අතර අවසාන කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 823.66ක් විය.එය ආරම්භක කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 3කින් වැඩිවීමකි. මුල් ත්ත්වය පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කිරීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කර ඇත. සිවිල් කටයුතු වලදී භූමියේ පිහිටීම සහ අනපේක්ෂිත සිදුවීම් නිශ්චිතව තීරණය කිරීමට නොහැකි අතර එම නිසා උපකල්පන කිහිපයක් මත පිහිටා ඇස්තමේන්තු පිළියෙල කර ඇත. මෙම කොටස ස්ථාන 03කදී ජලයෙන් යටවීමට බලපා තිබුණු අතර පාංශු ඛාදනය වැළැක්වීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන තිබුණි. මෙම ස්ථානවල මෘදු බිම් පිළියම් සහ උපශ්‍රේණි වැඩි දියුණු කිරීම් වැඩ බිමේදී තීරණය කරන ලදී. එම නිසා සිවිල් වැඩ කොන්ත්‍රාත් වලදී ප්‍රමාණ විචල්‍යතා පොදුවේ ඉඩ දෙනු ලබන අතර කොන්ත්‍රාත්වල භෞතික අවිනිශ්චිතතා ඉඩ සඳහා දෙනු ලබයි. කොන්ත්‍රාත්වක ඕනෑම අයිතමයක ප්‍රමාණ වෙනස්වීම් විචල්‍යතායක් ලෙස නොසලකන බව FIDIC කොන්ත්‍රාත් කොන්දේසිවල 13.1 උප වගන්තියෙන් අවධානය යොමු කර ඇත. අබලන් තත්ත්වයේ පැවති පාලම පුනරුත්ථාපනය කල අතර එය මුල් විෂය පථයෙහි එය නොතිබුනද එය පුනරුත්ථාපනය කර තිබුණි. ඊට අමතරව රබෑව සහ ඉකිරිගොල්ලාව නගරය අදාල | හේතුන් සහ ප්‍රමාණපත්‍ර වලට වඩා වැඩියෙන් ගෙවීම මත ඇතිවන විශාල වෙනස්කම්වල බලපෑම විමර්ශණය කල යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රාදේශීය සභාවලින් කරන ලද ඉල්ලීමට අනුව වැඩි දියුණු කරන ලදී. එම නිසා ඉහත අතිරේක වැඩවලට අදාල අයිතමයන් වැඩිවී තිබුණි. | |
| (ඇ) | ඒ 009 නුවර සිට යාපනය මාර්ගයේ රබෑව මැදවච්චිය දක්වා කොටසේ පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ කටයුතු දින 233ක ප්‍රමාදයන් සහිතව නිම කර තිබුණි. ඒ මත ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුවන්ගෙන් එකතුව රු මිලියන 39.97ක ප්‍රමාද ගාස්තු අඩු කරගෙන තිබුණද පසුව කාලය දීර්ඝ කිරීම සඳහා ඉඩ ලබා දෙමින් අඩු කර ගන්නාලද මුදල කොන්ත්‍රාත්කරුට නැවත ලබා දී තිබුණි. එවැනි කාල දීර්ඝ කිරීම් ලබා දීමේ ප්‍රතිඵලයක් ලෙස මූලික සහ පොදු පිරිවැය ඉහල යාම හේතුවෙන් ව්‍යාපෘතිය විසින් රු.මිලියන 4.27ක අමතර පිරිවැයක් දරා තිබුණි. | අමතර පිරිවැය දැරීමට සිදු වේ. | කොන්ත්‍රාත්කරුට පිළිගත හැකි කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුල කටයුතු නිමකිරීමට නොහැකි විට කොන්ත්‍රාත් කොන්දේසිවල 8.7 අනු වගන්තියට අනුව ප්‍රමාද හානි සේවාදායකයා අඩු කරනු ලැබේ. කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය අවසාන මාසය සඳහා ගෙවීම් සහතික නිකුත් කරන අවස්ථාවේදී කොන්ත්‍රාත්කරු කටයුතු නිමකර හෝ කාලය දීර්ඝ කිරීම් ලබා ගෙන නොතිබුණි.එම නිසා කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාද හානි අඩුකර ඇත. ඒ අතර කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කිරීම් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණු අතර ඉංජිනේරු සහ කොන්ත්‍රාත්කරු සාකච්ඡාකර සාධාරණීකරනය සඳහා වැඩිදුරටත් තොරතුරු ඉල්ලා සිටින ලදී.ලියවිලි සම්පූර්ණ කිරීමෙන් පසුව ඉංජිනේරුවරයා තමන්ගේ නිර්දේශය ඉදිරිපත් කර තිබුණි.සේවාදායකට පිළිගත හැකි වූ අතර අනුමැතිය ලබා දෙන ලදී. අනුමත කාල දීර්ඝ කිරීමෙන් පසුව කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය අවසන් වන තෙක් ප්‍රමාද හානි අඩු කිරීමේ හේතුවක් නොමැත. කොන්ත්‍රාත්කරු අඩු කරන ලද ප්‍රමාද හානි ලැබීමට සුදුසුකම් ලබයි. ඒ අනුව ගෙවීම් සිදු කරන ලදී. දීරඝ කරන ලද කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කරන ලද BOQ සඳහා කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය සඳහා ගෙවීම් ලැබීමට කොන්ත්‍රාත්කරු සුදුසු වේ. | කොන්ත්‍රාත් ගිවිසුම සමග අනුකූලවීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කොන්ත්‍රාත් ගිවිසුමේ පොදු වියදම් යටතේ එකවර ගෙවීම් සඳහා එකතුව රු. මිලියන 2ක් ඇස්තමේන්තුකර තිබුනද ඒ මත එකතුව රු.මිලියන 2.63ක් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුට පොදු වියදම් මත රු.මිලියන 0.63ක වැඩිපුර ගෙවීමක් සිදු කර ඇත. | අනවශ්‍ය ලෙස ව්‍යාපෘති පිරිවැය ඉහල යාමට ඉඩ ඇත. | 2020 ඔක්තෝබර් 14 දිනැති විගණන ගිවිසුම අනුව පහත සඳහන් රක්ෂණයන් සැපයීම සඳහා රු. මිලියන 2ක් ගෙවීමට ඇස්තමේන්තුකර ඇත. වැඩ රක්ෂණ- අඩුපාඩු දැනුම් දෙන කාලපරිච්ඡේදය අවසානය තෙක්<br><br>කොන්ත්‍රාත්කරුගේ උපකරණ සඳහා රක්ෂණය- අඩුපාඩු දැනුම් දෙන කාලපරිච්ඡේදය අවසානය තෙක්<br><br>තෙවන පාර්ශවය රක්ෂණය අඩුපාඩු දැනුම් දෙන කාලපරිච්ඡේදය අවසානය තෙක්<br><br>සේවක වන්දි ඉදිකිරීම්අවසානය තෙක්.<br><br>කොන්ත්‍රාත්තුවට අනුව ඉහත කාලපරිච්ඡේදය සඳහා රක්ෂණය සපයන අතර මුල් කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය මත රක්ෂණය අදාල දිනයන් වලදී කාලය ඉකුත් වේ. කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කිරීම් ලබා ගන්නේ නම් නව නිම කිරීම් දිනයට අනුව රක්ෂණය කොන්ත්‍රාත්කරු දීර්ඝ කරනු ලැබේ. ලංසුවේදී ඉහත සඳහන් කාලපරිච්ඡේදය සඳහා පමණක් රක්ෂණය සඳහා රේටයන් ඉදිරිපත් කර ත්බුණි. කාලය දීර්ඝ කිරීම් පිළිගැනීම යනු කොන්ත්‍රාත්කරු ප්‍රමාදයට හේතුවලින් ඉවත්වීම වන අතර ප්‍රමාදය සේවා දායකයා මත පැවරේ. එම නිසා අමතර කාලය සඳහා රක්ෂණ පිරිවැය ගෙවිය යුතු වේ. | වැඩිපුර කරන ලද ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. |
| (ඉ) | කොන්ත්‍රාත් ගිවිසුමේ පොදු කොන්දේසිවල 4.2 අනු වගන්තිය අනුව, කාර්යසාධන බැදුම්කර මත ලියවිලි පිළියෙල කිරීමේ සහ බැංකු ගාස්තු කොන්ත්‍රාත්කරුගේ උපකරණ, රක්ෂණය, තෙවන පාර්ශව රක්ෂණය, සේවක වන්දි රක්ෂණය කොන්ත්‍රාත් පැකේජය මත දෙන අත්තිකාරම් | අනවශ්‍ය ලෙස ව්‍යාපෘති පිරිවැය ඉහල යා හැක. | කොන්ත්‍රාත් කොන්දේසි 4.2 අනු වගන්තිය අනුව නිසි කාර්යසාධනයක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඔහුගේ වියදමින් කාර්යසාධන සුරක්ෂණය ලබා ගත යුතු බව දක්වා ඇත. මෙම වගන්තිය කාර්යසාධන ඇපකරය සඳහා පමණක් යොමු | ලංසු පිළියෙල කිරීමේදී මෙම අයිතමයන් පැහැදිලිව නිර්වචනය කල යුතු අතර ප්‍රමාණපත්වල ට ඇතුලත් |

ගෙවීම් සඳහා බැංකු ඇපකරය යනාදී පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දැරීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, ඉහත අවශ්‍යතාවයට පටහැනිව 2018 සහ 2019 වර්ෂවලදී පිරිනමන ලද කොන්ත්‍රාත් පැකේජවල ප්‍රමාණපත්වල පවතින ඇපකර සහ රක්ෂණ පිරිවැය ආවරණය කර ගැනීමට කොන්ත්‍රාත්කරුට 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 10.05ක් ගෙවා තිබුණි.

වේ. කොන්ත්‍රාත් කොන්දේසිවල කල යුතුය. අනෙකුත් අනු වගන්ති පිරිවැය දැක්වීමකින් තොරව රක්ෂණ ඉදිරිපත් කිරීමට යොමු වේ. රක්ෂණය, ඇපකරය යනාදී ඉදිකිරීම් කටයුතුවල අවධානම බෙදා ගන්නා ක්‍රමයක් වේ. රක්ෂණ සහ ඇපකර සැපයීම සඳහා ගෙවීම් නොකිරීමට ස්ථිර ප්‍රතිපත්තියක් නොමැත. පිරිවැය ගෙවීම සඳහා ගෙවීම් අයිතමයක් ලෙස මෙය එකතු කල හැක. ලංසු කරුවන්ට එමගින් පොදු කාර්ය පිරිවැය සංරචකය අඩුකර ගත හැකි වේ. අනෙක් අතට BOQ ඇතුලත් නොකරන්නේ නම් ලංසුකරු මෙම පිරිවැය ඇතුලත් කිරීමට ඔහුගේ පොදු කාර්ය පිරිවැය වැඩි කරනු ඇත. දීර්ඝ කරන ලද කාලපරිච්ඡේදය සඳහා පිරිවැය තක්සේරු කල හැක් විට BOQහි අයිතමයන් ඇතුලත් කිරීම වාසිදායක වේ. රේටයක් තරගකාරී බවට පත්වන අතර නව වැඩ සඳහා අඩු කරන ලද පොදු කාරය පිරිවැය අදාල වේ. සීපී 22,සීපී 23 හා සීපී 24 කොන්ත්‍රාත්වල භාවිතයක් ලෙස ඇපකර සහ රක්ෂණයක් සඳහා ගෙවීම් අයිතමයන් ඇතුලත් කර ඇත. ලංසුකරුවන් ලංසු සකස් කිරීමේදී දරණ ලද පිරිවැය ආපසු ගෙවීමේදී සලකා බලනු ලැබේ. එම නිසා එකගවූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව කාර්යසාධන ඇපකර , අත්තිකාරම් ඇපකර, වැඩ රක්ෂණය, කොන්ත්‍රාත්කරුගේ උපකරණ රක්ෂණය, තෙවන පාර්ශව රක්ෂණ සහසේවක වන්දි සඳහා ගෙවීම් සිදු කර ඇත.